**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව - 2023**

-----------------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ (1)154ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කොමිෂන් සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කොමිෂන් සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කොමිෂන් සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොමිෂන් සභාව සතු නොවන ප්‍රධාන කාර්යාලය පිහිටි ඉඩම සමාලෝචිත වර්ෂය තුළ රු. 1,177,880,000 කට ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කර තිබුණද ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | කොමිෂන් සභාව පිහිටි ඉඩම ප්‍රත්‍යාගණනය කර ඇති බව මූල්‍ය ප්‍රකාශනවල සටහන් 4.1 යටතේ හෙළිදරව් කර ඇති බව කාරුණිකව දන්වා සිටිමු. | ප්‍රධාන කාර්යාලය පිහිටි ඉඩම කොමිෂන් සභාව සතු නොවන බව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ප්‍රකාරව කටයුතු නොකර මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ ආදායම් ලෙස හඳුනාගත් බොල් ණය ආපසු ලැබීම් රු. 401,153 ක් නැවතත් බදු පෙර ශුද්ධ ලාභයට එකතු කර තිබුණි. එසේම එම වටිනාකමම නැවතත් කාරක ප්‍රාග්ධන විචලනයටද එකතු කර තිබුණි. තවද කාරක ප්‍රාග්ධන විචලනයට ගැලපිය යුතු ගෙවිය යුතු වියදම්වල වෙනස වූ රු. 247,296 ක්ද ගැලපීම් කර නොතිබුණි. තවද භාණ්ඩාගාර බිල්පත්වල අයෝජන මත ඉපයූ රු. 410,000,000 ක පොලී ආදායම මුදල් ප්‍රවාහයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ ගැලපීම් කර තිබුණද ආයෝජන ක්‍රියාකාරකම් යටතේ හඳුනාගෙන නොතිබුණි. | මෙය වැරදීමකින් සටහන් කිරීම අතපසු වී ඇත. නමුත් වර්ෂය අවසානයේ සමස්ත මුදල් ශේෂය සඳහා මින් බලපෑමක් ඇති වී නැත. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | කොමිෂන් සභාව විසින් මෘදුකාංග හා ජංගම රථයේ සම්පීඩක ඒකකයේ හානිය අලුත්වැඩියා කිරීමේ වියදම, නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනයට මාසික කුලිය, නඩත්තු ගාස්තු ඇතුළු උපදේශන සේවා | මෙම ගෙවීම් වර්ග 02 සඳහා කොමිෂන් සභා අනුමැතිය 2023 මාර්තු 09 දින සහ අප්‍රේල් 03 දිනවලදී ලැබී තිබුණද මෙම ගෙවීම් වවුචර් මූල්‍ය අංශයට 2023 මැයි 29 දින සහ 2023 ජූලි 05 දිනවලදී ලැබී තිබුණු අතර | වර්ෂයට අදාළ වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වියදම් සහ මානව සම්පත් කළමනාකරණ පද්ධතිය ස්ථාපිත කිරීමේ වියදම් සඳහා පෙර වර්ෂවලට අදාළව ගෙවූ රු. 12,467,039 ක වියදම සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබීම නිසා එම ප්‍රමාණයෙන් සමාලෝචිත වර්ෂයේ ශුද්ධ ලාභය අඩුවෙන් දක්වා තිබුණි. | ලැබුණු දිනවලදී මූල්‍ය අංශය ගෙවීම් සිදුකර ඇත. | |
| (ඇ) | 2023 දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශනවල වෙළඳ ණයගැති ශේෂය රු. 372,764,954 ක් වූ අතර එම ණයගැතියන් සම්බන්ධව මූල්‍ය ප්‍රකාශන සමහ ඉදිරිපත් කළ උපලේඛනය අනුව වටිනාකම රු. 370,622,742 ක් විය. ඒ අනුව රු. 2,142,212 ක් වුවද එම වෙනසට හේතු විගණනයට ඉදිරිපත් නොවුණි. | එකඟ වෙමි. | මූල්‍ය ප්‍රකාශනවල ශේෂයන් හා උප ලේඛනයේ ශේෂයන් සැසඳීම් කළ යුතු අතර වෙනසට හේතු විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනතේ 20 (2) (ඇ), 21 (2) (ආ) සහ 22 (2) (අ) වගන්ති | විධිවිධානයට අනුකූල නොවන ලෙස, 2018 වර්ෂයට පෙර කාලයට අදාළව මුදල් ලැබීමට පෙර සේවා සැපයීම හේතුවෙන් ලැබිය යුතුව තිබූ රු. 372,764,954 ක් 2023 දෙසැම්බර් 31 දින වන විටත් අයවී නොතිබුණි. | 2018 වර්ෂයට පෙර මුදල් ලැබීමට පෙර සේවා සපයා නොමැත. සේවා සැපයීමට පෙර බදු ඉන්වොයිස් නිකුත් කිරීම නිසා අයවිය යුතු මුදලක් ලෙස ගිණුම් ගතවී ඇත. 2018 වසරේ සිට මෙය නිවැරදි කරන ලදි. | 1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත ප්‍රකාරව මුදල් ලැබීමට පෙර සේවා සැපයීම් නොකළ යුතුය. ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 1991 අංක 25දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 17 වන වගන්තිය සහ ආස්ක් කේබල් විෂන් පුද්ගලික සමාගමට නිකුත් කළ බලපත්‍රයේ 5 වගන්තිය | වාර්ෂික පිරිවැටුම අනුව ගණනය කළ සෙස් වටිනාකම ගිණුම් වර්ෂයක් අවසන් වී එළඹෙන ජනවාරි 31 හෝ ඊට පෙර අයවිය යුතු වුවත් 2024මැයි 30 දින වන විටත් පෞද්ගලික සමාගමකින් 2023 වර්ෂයට අයවිය යුතුව තිබුණු රු. 3,812,242 ක් අයවී නොතිබුණි. | 2024 පෙබරවාරි 05, 2023 මාර්තු 04, 2023 මැයි 30 සහ 2023 ජුනි 07 දිනැති ලිපි මගින් අදාළ බදු සමහ සෙස් ගෙවිය යුතු ලෙස දැනුම් දී ඇති අතර එය අය කර ගැනීමට කටයුතු කරමින් සිටින බව දැනුම් දෙමු. | ගණනය කළ සෙස් වටිනාකම ගිණුම් වර්ෂය අවසන් වී එළඹෙන ජනවාරි 31 දින හෝ ඊට පෙර අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2011 අංක 21 දරන විදුලි සංදේශ බදු පනතේ I වන කොටසේ 3 වන වගන්තිය | ඩයලොග් සමූහයට අයත් පෞද්ගලික සමාගම් 03 කින් 2023 මාර්තු මාසයට අදාළව විදුලි සංදේශ බදු පිළිවෙළින් රු. 35,773,073, රු. 30,000,000, රු. 11,934,504 ක් ලෙස එකතුව රු. 77,707,577 ක් කොමිෂන් සභාවට අයවිය යුතුව තිබුණි. කෙසේ වුවත් එම මුදල ඩයලොග් සමූහය විසින් බොල් ණය ලෙස ණයගැතියන්ගෙන් කපා හැරීම මත ගෙවීම් නොකරන බව දන්වා තිබුණි. ඒ පිළිබඳව කොමිෂන් සභාව විසින් එම මුදල ගෙවිය යුතු ලෙස ඩයලොග් සමූහයට සහ භාණ්ඩාගාරයට දන්වා තිබුණද එම මුදල මූල්‍ය ප්‍රකාශනවලට හඳුනාගෙන නොතිබුණි. | ඩයලොග් සමූහයේ බොල් ණය මත ණයගැතියන්ගෙන් කපා හැර තිබූ රු. 77,707,577 ක මුදල ලැබිය යුතු විදුලි සංදේශ බදු ලෙස මූල්‍ය ප්‍රකාශවල ඇතුළත් කර ගැනීම සඳහා තරහකාරී අංශය මඟින් භාණ්ඩාගාරයට යවන ලද ලිපියට පැහැදිලි කිරීමක් 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර අවසන් කරන තුරු නොලැබුණු නිසා ලැබිය යුතු විදුලි සංදේශ බදු ලෙස දක්වා නැත. | 2011 අංක 21 දරන විදුලි සංදේශ බදු පනතේ I වන කොටසේ 3 වන වගන්තිය ප්‍රකාරව විදුලි සංදේශ බදු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 45,803,540,546 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 31,697,157,371 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 14,106,383,175 ක වැඩිවීමක් පවතින බව නිරීක්ෂණය විය. මෙම වැඩිවීමට පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී ආදායම රු. 9,821,338,734 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

කොමිෂන් සභාවේ ආදායම හා වියදම පසුගිය වසර හා සැසඳීමේදී සැලකිය යුතු විචලනයක් නිරීක්ෂණය විය. බලපත්‍ර ගාස්තු ආදායම රු. 10,156,878,457 කින් හෙවත් සියයට 54 කින්ද, දුරකථන කෙටි පණිවිඩ සේවා බදු රු. 56,061,385 කින් හෙවත් සියයට 24 කින්ද වැඩිවූ අතර නියාමන වියදම් රු. 260,359,079 කින් හෙවත් සියයට 124 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (ආ) | ණයගැති ශේෂය තුළ වූ රු. 2,174,406 ක සෘණ ණය ශේෂයන් 544 ක් 2023 දෙසැම්බර් 31 දින දක්වා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. එම ණය ශේෂ තුළ රු. 100 ට අඩු ණයගැතියන් සංඛ්‍යාව 415 ක් විය. | එකඟ වෙමි. | ණය ශේෂ කඩිනමින් නිරවුල් කිරීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2023 දෙසැම්බර් 31 දිනට වෙළඳ ණයගැතියන්ගෙන් රු. 372,764,954 ක මුදලක් අයවිය යුතුව පැවතුණි. ඒ පිළිබඳව 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල මුළු ණය ශේෂය වර්ෂ 02 කට වැඩි කාලයක සිට පැවත එන ණයගැතියන් වශයෙන් වර්ගීකරණය කර තිබුණද විගණනයේ තහවුරු කරගැනීම අනුව එම ණය ශේෂය තුළ 1976 වර්ෂයේ සිට පැවත එන රු. 15,103,410 ක් වූ ණය ශේෂයක්ද ඇතුළත් වී තිබුණි. හිඟ සංඛ්‍යාත ආදායම් අයකර ගැනීම සඳහා විධිමත් ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබීම හේතුවෙන් මෙම ණයගැතියන් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. තවද මුළු ණයගැති ශේෂයෙන් සියයට 46 කට වැඩි ප්‍රමාණයක් වූ රු. 174,800,000 ක් 1993 වර්ෂයේ සිට ඉලෙක්ට්‍රොනික්ස් පුද්ගලික සමාගමෙන්ද, සියයට 40 කට වැඩි ප්‍රමාණයක් වූ රු. 145,254,449 ක් 1976 වර්ෂයේ සිට ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවෙන්ද අයවිය යුතුව තිබුණි. | 2023 වසර අවසානයේ පවතින රු. 372,764,954 ක ශේෂය වසර 20 කට වඩා වැඩි ශේෂයන්ය. එය කාල වර්ගීකරණයේදී වසර 02 කට වඩා වැඩි ශේෂ ලෙස දක්වා ඇත. එම වසර 20 කට වඩා වැඩියෙන් අය වීමට තිබූ ශේෂයන් බව දන්වා සිටිමි. | හිඟ සංඛ්‍යාත ආදායම් අයකර ගැනීම සඳහා විධිමත් ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ ගෙවිය යුතු ගිණුම් ශේෂය තුළ එකතු වටිනාකම රු. 1,947,254 ක උපචිත වටිනාකම් දිගින් දිගටම ගෙවීම් කිරීමකින් තොරව උපචිතව දක්වා තිබුණි. | පෙර වර්ෂයක සිට පැවත එන නිරවුල් කර නොගත් උපයන විට ගෙවීම් රු. 56,537 ක්ද, කොමිෂන් සභාවේ සේවය කළ නිලධාරියෙකුගෙන් වැඩිපුර අයකරගත් රු. 12,657 ක ආපදා ණය ශේෂයක්ද, රු. 1,878,060 ක් කොමිෂන් සභාවේ සේවය කළ නිලධාරියෙකුගෙන් ලැබිය යුතු මුදලක්ද වේ. | නොගෙවීමට හේතු හඳුනාගෙන ගිණුම්වල අවශ්‍ය ගැලපීම් සිදු කළ යුතුය. |

## 3.2 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොමිෂන් සභාවේ ප්‍රධාන ගොඩනැගිලි දිගුවක් ඉදිකිරීමට අදාළ කොන්ත්‍රාත් වටිනාකම රු. 209,093,034 ක් වූ කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව නව ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු 2020 පෙබරවාරි 15 දින අවසන් කළ යුතු වුවද 2024 මැයි 30 දින වන විටත් ඉදිකිරීම් අවසන් කර නොතිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා කාලය දීර්ඝ කරගැනීමක් සිදුකර නොතිබුණි. තවද | මෙම ව්‍යාපෘතියට අමාත්‍ය මණ්ඩල අනුමැතියක් අවශ්‍ය බව තීරණය කිරීම නිසා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමින් සිටී. එම නිසා ඉදිකිරීම් කටයුතු නවතා තිබූ අතර 2023 මැයි 10 දිනැති කොමිෂන් සභා තීරණ ප්‍රකාරව නැවත ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම සිදුකර ඇත. මේ වන විට ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු අවසන් අදියරේ පවතින අතර ව්‍යාපෘති | කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලීය ගොඩනැගිල්ල නවීකරණය කිරීමේ කොන්ත්‍රාත්තුවේ ප්‍රමාණ පත්‍ර ඇස්තමේන්තු සකස් කිරීමේ කාර්යයන් සඳහා උපදේශක ගාස්තුව ලෙස 2015 ජනවාරි 25 දින මොරටුව විශ්ව විද්‍යාලයට රු. 10,057,910 ක් ගෙවා තිබුණු අතර එම වියදම කෙරීගෙන යන වැඩ ගිණුමේ ගිණුම්ගත කර තිබුණද 2024 මැයි 30 දින දක්වා ගොඩනැගිල්ලේ නවීකරණ කටයුතු සිදුකර නොතිබුණි. | කාලය දීර්ඝ කිරීම සඳහා කොන්ත්‍රාත්කරු අදාළ ඉල්ලීමක් කර ඇත. එම ඉල්ලීම ව්‍යාපෘති උපදේශන ඒකකය වන මොරටුව විශ්ව විද්‍යාලය විසින් ඇගයීම් කටයුතු සිදුකරමින් පවතී | |
| (ආ) | කදිරාන සංඛ්‍යාත පිරික්සුම් මධ්‍යස්ථානයේ ගොඩනැගිල්ල නවීකරණය හා ප්‍රතිසංස්කරණය කිරීම සඳහා එකතු කළ අගය මත බදු රහිත වටිනාකම රු. 139,882,281 කට 2019 ජනවාරි 31 දින පෞද්ගලික ආයතනයක් වෙත ප්‍රදානය කළද 2023 දෙසැම්බර් 31 දින වන විට දරන ලද වියදම රු. 102,662,861 ක් විය. කොන්ත්‍රාත්තුව නිම කිරීමේ දිනය 2019 නොවැම්බර් 11 දින වුවද 2024 මැයි 22 වන විටත් කොන්ත්‍රාත්තුව සම්පූර්ණ කර නොතිබුණි. | මේ වන විට කොන්ත්‍රාත්කරු වැඩ බිමෙහි වැඩ ආරම්භ කර ඇති අතර ඉතිරිව තිබූ වැඩ සඳහා නිසි ඇස්තමේන්තුවක් ව්‍යාපෘති උපදේශන ඒකකය වන මොරටුව විශ්ව විද්‍යාලය විසින් සකස් කර ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු අඛණ්ඩව සිදු කරමින් පවතී. මෙම ව්‍යාපෘතිය සඳහා ව්‍යාපෘති කාලය 2024 අගෝස්තු 31 දක්වා දීර්ඝ කර ඇත. ඒ සඳහා කොන්ත්‍රාත් දිගුවකට (Addendum) එළඹ ඇත. | කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව ඉදිකිරීම් කටයුතු නියමිත කාලය තුළ අවසන් කර ගැනීමට සහ ගිවිසුම් ප්‍රකාරව ප්‍රමාද ගාස්තු අය කරගත යුතුය. |
| (ඇ) | කොමිෂන් සභාව සහ කොන්ත්‍රාත්කරු සමඟ එළඹුණු හම්බන්තොට තොරතුරු තාක්ෂණ උද්‍යානයේ විදුලි සංදේශ මාධ්‍ය මධ්‍යස්ථානය ඉදිකිරීමේ ගිවිසුම අනුව අදාළ කොන්ත්‍රාත්තුව 2016 අගෝස්තු 10 දින නිම කිරීමට නියමිතව තිබුණද 2016 අගෝස්තු 10 දින ගිවිසුම අවසන් කරන විටද නිමකර තිබුණේ කොන්ත්‍රාත්තුවෙන් සියයට 33 ක් පමණි. ඒ අනුව මෙම කොන්ත්‍රාත්තුව විගණිත දිනය වූ 2024 මැයි 30 දින වන විට අතරමග නතර කර තිබුණු කොන්ත්‍රාත්තුවක් බවට පත්වී තිබුණි. එසේම 2023 දෙසැම්බර් 31 දින වන විට දරන ලද රු. 711,268,796 ක් නිශ්කාර්ය වියදමක් වී තිබුණු අතර එය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ නොනිමි වැඩ යටතේ දක්වා තිබුණි | රජය විසින් තිරණය කර ආරම්භ කළ මෙම ව්‍යාපෘතියට අමතරව ක්‍රියාත්මක විය යුතුව තිබූ අනෙකුත් ආශ්‍රිත ව්‍යාපෘති ආරම්භ නොකිරීම නිසාම ව්‍යාපෘතියේ අපේක්ෂිත ඉලක්ක ලබා ගැනිමට නොහැකි වී ඇති අතර දැනට පවතින ආකාරයෙන් ආයෝජකයන් සඳහා මෙම පරිශ්‍රය ලබා දීම සඳහා අභිලාශ (EOI) කැඳවීමක් සිදු කර ඇත. | වැය කළ මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |